


[වැඩසටහන] [நிகழ்ச்சிநிரல்] [**Program**]

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

# 77 වන නිදහස් දින සමරු උළෙල

# 2025

## වැඩසටහන

### 2025 පෙබරවාරි මස 02 වැනි ඉරිදා

ප.ව. 09.30 - නිදහස් මන්දිරයේදී පැවැත්වෙන පරිත්‍රාණ ධර්ම දේශනය

(I වන උපලේඛනය බලන්න)

### 2025 පෙබරවාරි මස 03 වැනි සඳුදා

පෙ.ව.6.30 - කොළඹ 02, හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී හීල් දානය පිළිගැන්වීම

(II වන උපලේඛනය බලන්න)

### 2025 පෙබරවාරි මස 04 වැනි අඟහරුවාදා

පෙ.ව.06.30 - බෞද්ධ ආගමික වතාවත් - කොළඹ 03, පොල්වත්ත ධර්මකීර්ත්‍යාරාම විහාරස්ථානයේදී.

පෙ.ව.06.30 - හින්දු ආගමික වතාවත් - වැල්ලවත්ත, මයුරපති ශ්‍රී පත්තරික්කාලි කෝවිලේදී.

පෙ.ව.06.15 - කතෝලික දේව මෙහෙය - බොරැල්ල සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේදී.

පෙ.ව.06.15 - ක්‍රිස්තියානි දේව මෙහෙය - කොළඹ 06, ප්‍රෙස්බෙටේරියන් දේවස්ථානයේදී.

පෙ.ව.06.00 - ඉස්ලාම් ආගමික වතාවත් - වැල්ලවත්ත, ජුම්මා පල්ලියේදී.

පෙ.ව.06.00 - මහාමාන්‍ය ඩී.එස්.සේනානායක මැතිතුමාගේ පිළිරුවට මල්දම් පැළඳවීම හා පුෂ්පෝපහාර පිරිනැමීම.

(III වන උපලේඛනය බලන්න)

## ප්‍රධාන උත්සවය
## 2025 පෙබරවාරි මස 04 වැනි අඟහරුවාදා
## නිදහස් චතුරස්‍රයේදී

පෙ.ව.07.20 - ආරාධිත අමුත්තන් සිය ආසනවල අසුන් ගැනීම.

පෙ.ව.07.40 - සම්මාන මුරය උත්සව භූමිය වෙත ගමන් ගැනීම ආරම්භ කිරීම.

පෙ.ව.07.50 - **ගරු අග්‍රවිනිශ්චයකාර මුර්දු නිරූපා බිදූෂිණි ප්‍රනාන්දු මැතිණියගේ පැමිණීම.**

**පිළිගැනීම :**

ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය
පී.රුවන් සෙනරත් මැතිතුමා,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ
ලේකම්, එස්. ආලෝකබණ්ඩාර මහතා

පෙ.ව.07.52 - **ගරු කතානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මැතිතුමාගේ පැමිණීම.**

**පිළිගැනීම :**

ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍ය ආචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න මැතිතුමා,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශ ලේකම්, එස්. ආලෝකබණ්ඩාර මහතා

පෙ.ව.07.55 - **ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණියගේ සම්ප්‍රාප්තිය.**

**පිළිගැනීම :**

ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
ආචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න මැතිතුමා,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ
ලේකම්, එස්. ආලෝකබණ්ඩාර මහතා

**පෙ.ව.08.00 - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ සම්ප්‍රාප්තිය.**

**පිළිගැනීම :**

ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය,
ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න මැතිතුමා,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, එස්. ආලෝකබණ්ඩාර මහතා,
ත්‍රිවිධ හමුදාධිපතිවරුන් සහ වැඩ බලන පොලිස්පති

ගරු ජනාධිපතිතුමාගේ සම්ප්‍රාප්තිය (සම්ප්‍රාප්තිය සැලකෙරෙන වාදනය - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව)

ත්‍රිවිධ හමුදාධිපතිවරුන් සහ වැඩ බලන පොලිස්පති විසින් ගරු ජනාධිපතිතුමා ප්‍රධාන කොඩි කණුව අසලට කැඳවා ගෙන යාම

පෙ.ව.08.04 - මඟුල් බෙර වාදනය සහ සක් පිඹීම මධ්‍යයේ ගරු ජනාධිපතිතුමා විසින් ජාතික ධජය එසවීම.

(IV වන උපලේඛනය බලන්න)

පෙ.ව.08.05 - පාසල් සිසු සිසුවියන් 44 දෙනෙකු විසින් ජාතික ගීය ගායනා කිරීම.
(සියලුම ආරාධිතයන්ට මේ සමඟ ජාතික ගීය ගායනා කිරීමට ආරාධනා කරනු ලැබේ)

(V වන උපලේඛනය බලන්න)

පෙ.ව.08.09 - ත්‍රිවිධ හමුදාධිපතිවරුන් සහ වැඩබලන පොලිස්පති විසින් ගරු ජනාධිපතිතුමා විශේෂ පීඨිකාව වෙත කැඳවා ගෙන යාම.

පෙ.ව.08.10 - පාසල් සිසුවියන් 16 දෙනෙකු විසින් “ජයමංගල ගාථා” සහ “දේවෝ වස්සතු කාලේන” ගාථාව ගායනා කිරීම.

(VI වන උපලේඛනය බලන්න)

පෙ.ව.08.16 - මාතෘ භූමියේ ස්වාධීනත්වයේත්, ස්වෛරීභාවයේත්, භෞමික අඛණ්ඩතාවයේත් තිර පැවැත්ම වෙනුවෙන් දිවි පිදූ සියලුම ශ්‍රී ලාංකිකයන් අනුස්මරණය කිරීම සඳහා විනාඩි 02ක නිශ්ශබ්දතාව.

පෙ.ව.08.18 - ජනාධිපති උත්තමාචාරය

පෙ.ව.08.25 - ගරු ජනාධිපතිතුමා විසින් ජාතිය ඇමතීම.

පෙ.ව.08.42 -ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය සහ ජාතික ශිෂ්‍ය භට බලකාය විසින් පවත්වනු ලබන සම්මාන පෙළපාලිය

( VII වන උපලේඛනය බලන්න)

පෙ.ව.09.24 - සංස්කෘතික සංදර්ශනය පැවැත්වීම.

(VII වන උපලේඛනය)

පෙ.ව.9.38 - ජාතික ගීය දමිළ භාෂාවෙන් ගායනා කිරීම.

පෙ.ව.09.42 - උත්සවයේ නිමාව සනිටුහන් කිරීම.

පෙ.ව.09.44 - ගරු ජනාධිපතිතුමාගේ නික්ම යෑම.

පෙ.ව.09.49 - ගරු අග්‍රාමාත්‍යතුමියගේ නික්ම යෑම.

පෙ.ව.09.52 - ගරු කතානායකතුමාගේ නික්ම යෑම.

පෙ.ව.09.54 - ගරු අග්‍රවිනිශ්චයකාරතුමියගේ නික්ම යෑම.

පෙ.ව.10.00 සිට - අනෙකුත් ආරාධිතයින්ගේ නික්ම යෑම.

මධ්‍යහ්න.12.00 - ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ගාලු මුවදොර පිටියේදී ශ්‍රී ලාංකීය ජාතිය වෙනුවෙන් ආචාර වෙඩි මුර 25 ක් පිරිනැමීම.

## I වන උපලේඛනය
## 2025 පෙබරවාරි මස 02 වැනි ඉරිදා

### සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනය නිදහස් මන්දිරයේදී පැවැත්වීම

2025.02.02 වැනි දින ප.ව. 09.30 ට නිදහස් මන්දිර පරිශ්‍රයේදී පරිත්‍රාණ ධර්ම දේශනය ත්‍රෛනිකායික අතිගෞරවණීය මහා නායක ස්වාමීන් වහන්සේලාගේ ආශිර්වාදයෙන් මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහ නිකායේ මල්වතු මහාවිහාර පාර්ශවයේ අතිපූජ්‍ය මහනායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන නායක ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි පැවැත්වේ.

**මෙහෙයවීම හා සංවිධානය -** ආර්.එම්.පී. රත්නායක මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

## II වන උපලේඛනය
## 2025 පෙබරවාරි මස 03 වැනි සඳුදා

### උදෑසන හීල් දානය පිළිගැන්වීම

2025.02.03 වැනි දින පෙ.ව.06.30 ට උදෑසන හීල් දානය - කොළඹ 02, හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී පිළිගැන්වේ.

**මෙහෙයවීම හා සංවිධානය -** ආර්.එම්.පී. රත්නායක මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

# III වන උපලේඛනය
# 2025 පෙබරවාරි මස 04 වැනි අඟහරුවාදා

## බෞද්ධ ආගමික වතාවත්

2025.02.04 වැනි දින පෙ.ව.06.30 ට, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහ නිකායේ මහ නායක මකුලෑවේ විමල මහා නායක ස්වාමින් වහන්සේගේ අනුශාසනා පරිදි, කොල්ලුපිටිය ධර්මකීර්ත්‍යාරාමාධිපති පූජ්‍ය ආචාර්ය බණ්ඩාරවෙල විමලධම්ම ස්වාමින් වහන්සේගේ මාර්ගෝපදේශකත්වයෙන් බෞද්ධාගමික වතාවත් කොල්ලුපිටිය, ධර්මකීර්ත්‍යාරාම විහාරස්ථානයේදී පැවැත්වේ. මේ සඳහා රජය නියෝජනය කරමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය, ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මැතිතුමා, ගරු විපක්ෂ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස මැතිතුමා, ගරු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනවි මැතිතුමා, ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ආචාර්ය ඒ. එච්. එම්. එච්. අබයරත්න මැතිතුමා, ගරු පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍ය පී. රුවන් සෙනරත් මැතිතුමා, ගරු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගමගෙදර දිසානායක මැතිතුමා ඇතුළු ගරු අමාත්‍යවරුන්, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහභාගී වෙති.

මෙහෙයවීම හා සංවිධානය - ආර්.එම්.පී. රත්නායක මහතා
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්,
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

## හින්දු ආගමික වතාවත්

2025.02.04 වන දින පෙ.ව. 06.30ට, කොළඹ 04 පිහිටි වැල්ලවත්ත, මයුරපති ශ්‍රී පත්තරික්කාලි කෝවිලේදී පැවැත්වේ. මේ සඳහා රජය නියෝජනය කරමින් ගරු ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය රාමලිංගම් චන්ද්‍රසේකරන් මැතිතුමා, ගරු කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිණිය සහ ගරු වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත් සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා යන අය සහභාගී වෙති.

මෙහෙයවීම හා සංවිධානය - වයි. අනුරුත්තන් මහතා
අධ්‍යක්ෂ,
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු
දෙපාර්තමේන්තුව.

## කතෝලික ආගමික වතාවත්

2025.02.04 වැනි දින පෙ.ව. 06.15 ට බොරැල්ල සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයේදී පැවැත්වේ. මේ සඳහා රජය නියෝජනය කරමින් ගරු විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය ආචාර්ය ක්‍රිෂාන්ත අබේසේන මැතිතුමා, ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍ය ඇන්ටන් ජයකොඩි මැතිතුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ස්ටේෆ්නි ප්‍රනාන්දු මැතිතුමා සහභාගී වේ.

මෙහෙයවීම හා සංවිධානය - එම්.චතුරි පින්තු මිය
අධ්‍යක්ෂ,
ක්‍රිස්තියානි ආගමික කටයුතු
දෙපාර්තමේන්තුව.

## ක්‍රිස්තියානි ආගමික වතාවත්

2025.02.04 වැනි දින පෙ.ව. 06.15 ට, කොළඹ 06, ප්‍රෙස්බෙටේරියන් දේවස්ථානයේදී සියලු සභාවන්ගේ නායකයන්ගේ එකමුතුවෙන් ක්‍රිස්තියානි දේව මෙහෙය පැවැත්වේ.

මෙහෙයවීම හා සංවිධානය - එම්.චතුරි පින්තු මිය
අධ්‍යක්ෂ,
ක්‍රිස්තියානි ආගමික කටයුතු
දෙපාර්තමේන්තුව.

## ඉස්ලාම් ආගමික වතාවත්

2025.02.04 වැනි දින පෙ.ව. 06.00 ට, වැල්ලවත්ත, ජුම්මා පල්ලියේදී පැවැත්වේ. මේ සඳහා නියෝජ්‍ය කථානායක ගරු. වෛද්‍ය රිස්වි සාලී මැතිතුමා, ගරු අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය මොහොමඩ් මුනීර් මුලාෆර් මැතිතුමා ඇතුළු මුස්ලිම් ආගමික ප්‍රභූවරු සහභාගී වෙති.

මෙහෙයවීම හා සංවිධානය - එම්. එස්. එම්. නවාස් මහතා,
අධ්‍යක්ෂ,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු
දෙපාර්තමේන්තුව.

## මහාමාන්‍ය ඩී.එස්.සේනානායක මැතිතුමාගේ පිළිරුව අබියස පුෂ්පෝපහාර පිරිනැමීම

2025.02.04 වැනි දින පෙ.ව.06.00 ට නිදහස් චතුරශ්‍රයේ පිහිටි මහාමාන්‍ය ඩී.එස්.සේනානායක පිළිරුව අබියස ඇති කොඩි කණු පළාත් කොඩිවලින් සරසා තැබීමට කටයුතු කරනු ඇත.

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර ගරු හනීෆ් යූසුෆ් මහතා සහ ඩී.එස්. සේනානායක ගුණ සමරු කමිටුවේ සභාපති හිටපු කථානායක දේශබන්දු කරු ජයසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඩී.එස්. සේනානායක මැතිතුමාගේ පිළිරුවට මල්දම් පැළඳවීම කොළඹ මහනගර සභාවේ නාගරික කොමසාරිස් පාලිත නානායක්කාර මහතා විසින් සිදු කරනු ලබන අතර, හිටපු රාජ්‍ය අමාත්‍ය රුවන් විජේවර්ධන මැතිතුමා, හිටපු අමාත්‍ය වසන්ත සේනානායක මැතිතුමා, ජ්‍යෙෂ්ඨ උපසභාපති හිටපු ආණ්ඩුකාර හේමකුමාර නානායක්කාර මැතිතුමා, ප්‍රධාන ලේකම් ආචාර්ය අයි. දිසානායක මහතා, භාණ්ඩාගාරික රංජිත් කොඩිකාර මහතා, උපසභාපති හිටපු අමාත්‍ය පී. දයාරත්න මැතිතුමා, උපසභාපති හිටපු අමාත්‍ය ලාල් ධර්මප්‍රිය ගමගේ මැතිතුමා, හිටපු භාණ්ඩාගාරික චීනයේ හිටපු ශ්‍රී ලංකා තානාපති ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා, උපලේකම් ජී.එච්.ඒ. ගුණපාල මහතා, උපලේකම් ඩබ්. ඒ. සී. පී. විජේරත්න මහතා, විධායක සභික පී. හේවාගේ මහතා, විධායක සභික බී.එම්.ඒ.ටී. කුරේ මහතා, විධායක සභික උමේෂ් දේවසුරේන්ද්‍ර මහතා, විධායක සභික ශමින්ද ඊරියගම මහතා යන අය විසින් පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම සිදු කරනු ලබයි.

මෙහෙයවීම - පාලිත නානායක්කාර මහතා,
නාගරික කොමසාරිස්, කොළඹ මහ නගර සභාව
ආචාර්ය අයි.දිසානායක මැතිතුමා,
ඩී.එස්.සේනානායක අනුස්මරණ කමිටුවේ ප්‍රධාන ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය

## IV වන උපලේඛනය

### මඟුල් බෙර වාදනය හා සක් පිඹීම

රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සංවිධානය කිරීම - කසුන් සෙනෙවිරත්න මහතා,
සහකාර අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## V වන උපලේඛනය

### ජාතික ගීය ගායනා කිරීම

පහත සඳහන් විද්‍යාල නියෝජනය කරමින් සිසු සිසුවියන් 44 දෙනෙකු ජාතික ගීය ගායනා කිරීම.

1. ආරක්ෂක සේවා විදුහල, කොළඹ 02
2. නාලන්දා විද්‍යාලය, කොළඹ 10
3. මුස්ලිම් කාන්තා විදුහල, කොළඹ 04
4. රාජකීය විද්‍යාලය, කොළඹ 07
5. රාමනාදන් හින්දු විදුහල, කොළඹ 04
6. සුහිරා විදුහල, කොළඹ 10
7. සියලු සාන්තුවරයන්ගේ බාලිකා මහා විද්‍යාලය, කොළඹ 10
8. සුසමයවර්ධන විද්‍යාලය, කොළඹ 08
9. හින්දු විදුහල, කොළඹ 04

සංගීතය මෙහෙයවීම - පෙරදිග වාද්‍ය වෘන්දය
ශ්‍රී ලංකා නාවික හමුදාව

පුහුණු කිරීම හා මෙහෙයවීම - වරුණ අලහකෝන් මහතා
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය
අධ්‍යාපන අමාත්‍යාංශය

## VI වන උපලේඛනය

### “ජයමංගල ගාථා” සහ “දේවෝ වස්සතු කාලේන” ගාථාව ගායනා කිරීම

පහත සඳහන් විද්‍යාල නියෝජනය කරමින් සිසුවියන් 16 දෙනෙකු විසින් "ජයමංගල ගාථා" සහ "දේවෝ වස්සතු කාලේන" ගාථාව ගායනා කිරීම.

1. දේවි බාලිකා විද්‍යාලය, කොළඹ 08
2. විසාකා විද්‍යාලය, කොළඹ 04
3. සිරිමාවෝ බණ්ඩාරනායක විදුහල, කොළඹ 07

සංගීතය හා මෙහෙයවීම - පෙරදිග වාද්‍ය වෘන්දය
ශ්‍රී ලංකා නාවික හමුදාව

පුහුණු කිරීම හා මෙහෙයවීම - වරුණ අලහකෝන් මහතා,
අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය),
අධ්‍යාපන අමාත්‍යාංශය

## VII වන උපලේඛනය

### ආචාර පෙළපාලියේ සංයුතිය පහත සඳහන් පරිදිය

| | සෙබළුන් සංඛ්‍යාව | රථ සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | - 1873 | 04 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | - 752 | |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | - 548 | |
| ශ්‍රී ලංකා පොලීසිය | - 317 | |
| ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකාය | - 198 | |
| සිවිල් ආරක්ෂක බලකාය | - 182 | |
| ජාතික ශිෂ්‍ය භට බලකාය | - 424 | |
| විශ්‍රාමික නිලධාරීන් | - 22 | 01 |
| ආබාධිත නිලධාරීන් | - 29 | 02 |
| **එකතුව** | **- 4345** | **07** |

## VII වන උපලේඛනය

### සංස්කෘතික සංදර්ශනයේ සංයුතිය

**සහභාගීත්වය**

| | |
|---|---|
| සංස්කෘතික අමාත්‍යාංශයේ ජාතික නර්තන සංචිතය | - 168 |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සංස්කෘතික ශිල්පින් | - 60 |
| ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංස්කෘතික ශිල්පින් | - 80 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදවේ සංස්කෘතික ශිල්පින් | - 56 |
| ශ්‍රී ලංකා පොලීසියේ සංස්කෘතික ශිල්පින් | - 35 |
| සිවිල් ආරක්ෂක බලකායේ සංස්කෘතික ශිල්පින් | - 40 |
| ජන කලා කේන්ද්‍රය | - 41 |
| ජාතික තරුණ සේවා සභාව | - 35 |
| බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය | - 30 |
| සෞන්දර්ය විශ්ව විද්‍යාලය | - 78 |
| සංස්කෘතික මධ්‍යස්ථාන | - 60 |
| රාජ්‍ය නැටුම් කණ්ඩායම | - 07 |

| | |
|---|---|
| මෙහෙයවීම | - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය |
| සම්බන්ධීකරණය | - ආචාර්ය සංජීව ප්‍රසාද් රණසිංහ අධ්‍යක්ෂ (සංස්කෘතික ප්‍රවර්ධන)<br>- බුද්ධශාසන , ආගමික හා සංසකෘතික කටයුතු අමාත්‍යාංශ |
| නර්තන නිර්මාණය | - මහාචාර්ය සමන් කුමාරතුංග , පීඨාධිපති, නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය විශ්ව විද්‍යාලය |